


කොළඹ ලංකා පැරණි පාර්ලිමේන්තුව Photo - (Late) Ajith Dahanayake

**ඉස්සර පාර්ලිමේන්තුවට විද්වතුන් එන්නේ හරවත් විවාද නරඹන්නටය. එහෙත් අද ඔවුන් එන්නේ සණ්ඩු සරුවල් බැලීමට ය.**

1500 ක් පමණ වූ කාර්ය මණ්ඩලයක් පාර්ලිමේන්තුවේ ඇත. දිනකට කෙරෙන වියදම මිලියන ගණනකි. මන්ත්‍රීවරයෙකු නඩත්තු කිරීමට රුපියල් ලක්ෂ 5 ක් මාසයකට වැයවේ. සාමාන්‍යයෙන් මස කට දින අටක් පමණද, නොවැම්බර් දෙසැම්බර් මාසවලදී අයවැය විවාදය සඳහා සියළුම දිනවල රැස්වන පාර්ලිමේන්තුවේ සමස්ථ ක්‍රියාවලියද මහජනතාවට සෙතක් සලසන අයුරින් සිදුවිය යුතු ය.

වත්මන් ක්‍රියා පිළිවෙත අනුව ඕනෑම තත්වයක කෙනෙකුට මන්ත්‍රීවරයෙකු විය හැකිය. එයට කිසිදු විශේෂ සුදුසුකමක්, දැනුමක්, බුද්ධියක් අවශ්‍ය නොවේ.

# නව පාර්ලිමේන්තුවේ වගකීම



කෝට්ටේ අද රැස්වන ශ්‍රීලංකා නව පාර්ලිමේන්තුව

**ශ්‍රී** ලංකා නව පාර්ලිමේන්තුව අප්‍රියෙල් මස **22** වෙනි දා කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුරයේ දී රැස්වීමට නියමිත ය.

අභිනව පාර්ලිමේන්තුවට පත්වූ මන්ත්‍රීවරුන් අබියස ඇති කාර්යභාරය හා වගකීම සුළුපටු නොවේ.

වෙනත් ඕනෑම රටක මෙන්ම ශ්‍රීලංකා පාර්ලිමේන්තුවට පැවරෙන ප්‍රධාන රාජකාරි දෙකකි. එනම් රටේ නීති සම්පාදනය හා අරමුදල් පාලනයයි. මහජන සුබසාධනය උදෙසා නීති රීති සකසා සාකච්ඡා කොට අනුමත කිරීමේ යාන්ත්‍රණය හෙවත් ව්‍යවස්ථාදායකය Legislation පාර්ලිමේන්තුව ක්‍රියාකරයි. එමෙන්ම රජයට මුදල් ලබා ගැනීම, වියදම්කිරීම හා විගණනය කිරීමද පාර්ලිමේන්තුව මගින් ඉටුවේ. මීට අමතරව ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්න සහ රටට බලපාන ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කිරීම ද මෙ මගින් ඉටුවේ.

මෙම ප්‍රධාන රාජකාරි ඉටුකරලීමට සැබැවින්ම නව පාර්ලිමේන්තුව කොතරම් දුරට සමත්වේද යන්න පිළිබඳව මඳක් හෝ සාකච්ඡාකිරීම කාලෝචිතයයි සිතමි.

මෑතදී නිමවූ මැතිවරණ වේදිකාවේ අසන්නට ලැබුණු ප්‍රධාන මාතෘකාවක් වූයේ ව්‍යවස්ථා සංශෝධනයයි. **1998** වසරේ දී ව්‍යවස්ථා සංශෝධනය පමණක් නොව අළුත්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ද ඉදිරිපත්විය. එහෙත් ඒ පිළිබඳව කිසිදු විද්වත් සාකච්ඡාවක් පාර්ලිමේන්තුව තුළ සිදු වුණේ නැත.

රජයේ ඒක පාක්ෂික කැමැත්තෙන් හා විරුද්ධ පක්ෂයේ සම්ප්‍රදායික විරුද්ධ මතවාදත් නිසා එය කිසිදු සාකච්ඡාවකින් තොරව නතර විය. මැතිවරණ ක්‍රමය පිළිබඳව විවිධ අදහස් පළවී ඇත. එහෙත් මේ වන තුරු මැතිවරණ ක්‍රමය හෝ මනාප ක්‍රමය හෝ වෙනස් කිරීමට බුද්ධිමත් සාකච්ඡා පාර්ලිමේන්තුව තුළ කෙරී නැත.

රජයේ ආයතන වල ගිණුම් කටයුතු පරීක්ෂා කිරීමේ කාරක සභා දෙකක් තිබේ. මේවායේ අවසන් ප්‍රථිඵල ලැබෙන්නේ අශ්වයා පැනගිය පසු ස්තාල වසා දමන්නාක් මෙන් යයි කිව හැකිය. මහජනයා වෙනුවෙන් ප්‍රශ්න ඇසීමට මෙන්ම, මහජන ගැටළු වලට විසඳුම් ලබාදීමේ ක්‍රියාවලියක් ද පාර්ලිමේන්තුවේ ඇත. එහෙත් මේවායින් වන සේවය ඉතාමත් අල්ප ය. ශ්‍රීලංකාවේ ආර්ථික, සාමාජයික හා දේශපාලනික පිළිලයක් බඳු වූ උතුරේ ප්‍රශ්නය විසඳීමට පාර්ලිමේන්තුව තුළින් කිසිදු දායකත්වයක් නොලැබිණ. රටට, මහජනතාවට ඉතා විශාල කාර්‍යභාරයක් ඉටුකළ හැකි ආයතනය පාර්ලිමේන්තුවයි.

එයට පත්වන මන්ත්‍රීවරු එහි ජීවනාලිය බඳු ය. ඔවුන්ගේ දායකත්වය හා කැපවීම ඉතා ඉහළ මට්ටමක පැවතිය යුතුය. පාර්ලිමේන්තු විවාදවල තත්වය ඉතා උසස් පිළිවෙලක පැවතිය යුතු ය.

මීට වසර 40 කට පමණ පෙර ආර්ථික විද්‍යාව උගන්නා විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ අමතර කියවීම් සඳහා පාර්ලිමේන්තු හැන්සාර්ඩ් වාර්තා පරිශීලනය කළහ. එහෙත් අද පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තා කියවන කිසිදු ශිෂ්‍යයෙකු, හෝ විද්වතෙකු නැත.

ඉස්සර පාර්ලිමේන්තුවට විද්වතුන් එන්නේ හරවත් විවාද නරඹන්නටය. අද එන්නේ සණ්ඩු සරුවල් බැලීමට ය. මෙම තත්වය වෙනස් කරගත හැක්කේ කතානායක ප්‍රමුඛ මන්ත්‍රීවරුන්ට ය.

1980 දී යාපනයේ දිස්ත්‍රික් මන්ත්‍රීවරයෙකුගේ අභාවය නිසා පුරප්පාඩුවක් ඇතිවිය. ඒ සඳහා කෙනෙකු නම්කරන ලෙස ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණට දැන්වූයෙන් ඒ සඳහා නම් කෙරුණේ ත්‍රස්තවාදී නායකයෙකු වූ තන්ගතුරේ හෙවත් කුට්ටිමනිය. මේ පිළිබඳ එදා සිටි විපක්ෂනායකයා වූ අමිර්තලිංගම් මහතාගෙන් රජයේ මන්ත්‍රීවරු ප්‍රශ්න කරන ලදුව ඔහු තම සරල පිළිතුරෙන් වැදගත් පණිවුඩයක් පාර්ලිමේන්තුවට දුන්නේය. ඔහුගේ පිළිතුර වූයේ "මට කිසි විටෙක ත්‍රස්තවාදියෙකු, මිනීමරුවෙකු, අපරාධකාරයෙකු මන්ත්‍රීවරයෙකු කරන්න අවශ්‍ය නැත. එහෙත් පවතින මැතිවරණ ක්‍රමය හා නීතිය අනුව ඕනෑම අපරාධ කරුවෙකුට, ත්‍රස්තවාදියෙකුට, මිනීමරුවෙකුට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වීමට හැකි බව ඔප්පුකර පෙන්වීමට මෙ මගින් පුළුවන් " යන්නයි.


**ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරි**

♦ **මේජර් වී. බී. කරුණාරත්න**

**Major V. B. Karunaratne**

***Ex Deputy Sergeant-At-Arms in Sri Lanka Parliament***

**Oxford UK**





# රාමා සීතා සහ රාවණා



රාමා හා සීතා විවාහ වූ දා මංගල ඡායාරූපය

**හු**හාක් ඉස්සර දවසක වැල්ලවත්තෙ ප්ලාසා සිනමා හලේ පෙන්නපු දෙමළ චිත්‍රපටියක් බලන්න මම ගියා. ඒ පික්චර් එකේ නම රාම සීතා කල්‍යාණම්. (ඒකෙ තේරුම රාමා හා සීතාගේ විවාහය) රාම සීතා හා රාවණා පිළිබඳ කතාව අපි පොඩිකාලෙ ඉඳලා අහලා තිබුණු නිසයි මට හිතුනේ මේක චිත්‍රපටියේ එන්නෙ කොහොමද කියලා බලන්න. රාමා වීරයා. රාවණා දුෂ්ටයා කරලා තිබුණා. එතකොට දිග වල්ගෙකුත් එක්ක වානර හනුමන්තත් ඉන්නවා. රාවණාට හිටියෙ ශිවාජි ගනේෂන්. රාවණා රැවුල කරකවලා හහ්! හහ්! ගාලා හිනාවෙනවා. මට මතක හැටියට ඒ චිත්‍රපටිය මහ දුර්වල විදියට හදලා තිබුණේ. අද වගේ දවසක හොලිවුඩ් වල ඒක හැදුව නම් නවීන සිනමා තාක්ෂණයත් එක්ක, එහෙනම් ඒක මහා දැවැන්ත අපූර්ව නිර්මාණයක් වේවි දැන් පෙන්නන **අවතාර්** චිත්‍රපටය වගේ.

**වාල්මිකී** කියන රිෂිවරයා **රාමායනය** ලිව්වෙ භාරතයේ වීර කතාවක් හැටියට. එතකොට ග්‍රීසියෙත් අප්‍රමාණ වීරකතා ගෙතෙමින් තිබුණා. ඉතා ශක්තිමත් බලවත් තරුණ මිනිසුන් ගැන. ලස්සන කාන්තාවන් ගැන. ඒ කාන්තාවන් පැහැරගෙන ගියාම අර වීරයන් ගිහින් බේරගෙන එනවා. ට්‍රෝයි රාජ්‍යයේ හෙලන් (Helen of Troy) ඒ වගේ ග්‍රීක වීරකතාවක්.

වාල්මිකී ඉන්දියන්කාරයෙක් හන්දා රාමා යහපත් සුදු චරිතයක් හැටියටයි නිරූපණය කළේ. රාවණා මහා නොසංඩාල දුෂ්ටයෙක්. හැබැයි එයා ලංකාවෙ රජ්ජුරුවො. ඒ වගේම යක්ෂ ගතිගුණ තියනවා රාවණාට. ඔලු දහයකුත් තිබුණා. ඒ නිසයි රාවණාට දසිස් (දස හිස්) යන නමකුත් පටබැඳලා තිබුණේ. කොහොම හරි මේ රාමායනය ඉන්දියන් කාරයින්ගෙ හිතට තදින් කා වැදුණා. ඒ නිසාම ඉන්දියාවෙ රාමා සීතා හනුමන්තා දේවත්වයෙන් අදහන්න පටන්ගත්තා. රාමා විෂ්ණු දෙවියන්ගේ දස අවතාරෙන් එකක් හැටියටත් අරගෙන තියනවා.

ඕනම දෙයක් ආයි සෙවිල්ලක් බැලිල්ලක් නැතුව අදහන හින්දු භක්තික ඉන්දියාව මේ කතාව ඇත්තක්ය කියලා හිතන්න පටන්ගත්තා. දැන් ඒක ඒ රටේ මුළු ජන සංහතියටම පීර්ණ වෙලා. ඉන්දියාව එහෙන් රාමා සීතා ඉහළින් පිළිගන්න කොට මෙහේ ලංකාවෙත් රාවනා ගැන කතාකරන්න පටන්ගත්තා. හුඟක් ඉස්සර අපේ මාම කෙනෙක් මට මෙහෙම කියලා තිබුණා. (මේ මාම ගැන විල්ෆ්‍රඩ් දන්නවා)

"පුතේ රාවණා රජ්ජුරුවො අපේ පැරණිම මුත්තා. ඉතාම බලසම්පන්න කෙනෙක්. ලෝකයේ මුල්වරට අහස්යාත්‍රාවක් (Private Jet) එකක් තිබුණේ එයාට. ඒකෙ නම දඬුමොණරෙ (Peacock Chariot) ඒ කාලෙ ඉන්දියාවෙන් බාගයක් අයිති රාවණා මුත්තා රජ්ජුරුවන්ට. එයා ඒ අයිති ඉඩම් කඩම් බලන්න ගියේ දඬුමොනරෙන්. ඒ ගිය ගමන් සීතාව දැකලා තමයි ඩැහැගෙන ආවෙ. ඒ වුණාට අනේ ඇඟට අතක් වත් තිබ්බෙ නැහැ. මොකද සිංහල මිනිස්සු වලත්ත වැඩ කරන්නෙ නැහැ. සීතව හිරකරලා තිව්වෙ රාමට පාඩමක් උගන්නන්න. පාඩම මොකක්ද? කසාද බැන්ද නම් ගෑනිට හොඳට සලකපන් ! "

නුවර එළියෙ පැත්තෙ තියනවා **රාවණ ඇල්ල** කියල දිය ඇල්ලක්. එතකොට එහේම තියනවා **සීතා එළිය** කියලා තැනකුත්. මේ නම් කොයි කාලෙ කවුරු දාපුවද දන්නෙ නැහැ. මේ නිසා ලංකාවෙ බොහෝ අය අපේ මාම වගේ හිතලා කියනවා ඇත්තටම රාවණ කියලා රජ කෙනෙක් ලංකාවෙ හිටියයි කියලා.

මට මේ රාමායනය මතක්වුණේ ලංකාවෙ අපේ සංචාරක මණ්ඩලය කරන්න යන ගොන් වැඩක් ගැන අහන්න ලැබිලා. සංචාරක ව්‍යාපාරය දියුණු කරගන්න කියලා ඉන්දියාවෙ ඉන්න රාමායන පිස්සන්ට ලංකාවට අඬගහනවා සීතා එළිය පෙන්නන්න. පෙන්නලා ගාණක් හොයාගන්න. දැන් අවුරුදු දෙකකට තුනකට ඉස්සෙල්ලා ඉන්දියාවයි ලංකාවයි යා කරන පාලමක් දාන්න ලෑස්ති වුනා සේතු සමුද්‍රම් කියලා. හොඳ වෙලාවට ඒක නැවතුණා. දැන් ආයිත් හදන්නෙ ඒ මිත්‍යා කතාවලට පණ දීලා තව සංකල්පයක් හදන්න. මේ කතාව මෙතනින් ඉවර නෑ. ලබන කලාපෙන් මං ඉතුරු ටික කියන්නම්. මතකද හික්කඩුව විනාස කරන 'හික්කා සංදර්ශණ' ? අපේ රටේ ගොං පාට් වලින් අඩුවක් නෑ මල්ලියෙ !

♦ වෙලේගෙදර රාළ London

## Bananas as good as drugs for treating HIV - Scientists



**BANANAS** could be the key to stopping the spread of HIV, scientists said today.

Researchers have found a chemical in bananas, called BanLec, which they say is as good as current anti HIV drug sat stopping the virus spreading.

The University of Michigan team say the breakthrough could lead to radical new low-cost treatments for developing countries. The chemical is a form of lectin, a naturally occurring chemical in plants, where it halts the chain of reaction that leads to a variety of infections.

" HIV is still rampant in the US and the explosion in poorer countries continues to be a bad problem because of tremendous human suffering and the cost of treating it. Said Professor David Marvovitz of Michigan. **( Evening Standard)**


**එක්සත් රාජධානියේ සිංහළ සුබසාධක සංගමය**

**වාර්ෂිකව ඉදිරිපත් කරන**

**නැගණහිර ලන්ඩනයේ බක්මහ උලෙළ**

**2010 අප්‍රියෙල් මස 18 වන ඉරිදා**

**සවස 1 සිට 7 දක්වා**

**තැන Venue: Plashet Girls School**

**Plashet Grove**

**East Ham, London E6 1DG**

**( Nearest underground: East Ham)**

සියළුම වයස්වල අය සඳහා අවුරුදු ක්‍රීඩා

ළමයින්ගේ නැටුම් ගැයුම් නාට්‍ය

සම්ප්‍රදායානුකුල කෑම බීම රසකැවිලි

සජීවී සංගීතය

**ITN TV crew will record the event live**

*For more info*: 020 8594 4135 / 020 8594 8237

020 7474 4595 / 07957313287